# දහසක් මහා වැව්

කෘෂිකර්මය අමතක කර රටක් කරවිය හැකි නො වෙයි. ඊනියා කාර්මික රටවල් ද කෘෂිකර්මය අමතක කර නැත. එමෙන් ම කිසිම රටකට දේශීය නිෂ්පාදන ද අමතක කළ නො හැකි ය. රටකට තිබිය යුත්තේ ජාතික ආර්ථික ප්‍රතිපත්තියකි. අපේ රටට තබා, යුරෝපයෙන් හා යුරෝපීයයන් විසින් ජනපද කෙරුණු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව ආදී රටවල් හැරුණු කොට අනෙක් රටවලට ද ජාතික ආර්ථික ප්‍රවාද නො මැත. ඇතැම් ආසියාතික රටවලට ජාතික ආර්ථික ප්‍රතිපත්ති ඇති බව සැබෑ ය. එහෙත් මේ ජාතික ප්‍රතිපත්ති යනු බටහිර ආර්ථික ප්‍රවාද තම රටවල ක්‍රියාත්මක කිරීම ය. එයින් ඒ රටවලට තාවකාලික ජයග්‍රහණ හිමිවිය හැකි නමුත් දිර්ඝකාලීනව ගත්කල යහපතක් වී නැති බව යථාකාලයේ දී පෙනී යනු ඇත. බටහිර ආර්ථික ප්‍රවාද මත පදනම් වී සකස් කෙරෙන ආර්ථිකයක් මෙහෙයවීමේ හැකියාව බටහිරට ඇත. අපට නියම ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කරගත හැක්කේ බටහිර රටවල් විසින් අප මෙහෙයවනු ලැබීමට ඇති ඉඩකඩ ද පරාජය කිරීමෙන් ය. අප බටහිර ආර්ථික වලල්ලෙන් හා වහල්බවින් මිදිය යුතු ය. මෙයින් කියැවෙන්නේ අප අන් රටවලින් හුදකලා විය යුතු ය යන්න ද නො වෙයි. අන් රටවලින් හුදකලා විය යුතු යැයි අප පවසන බවක් කියන්නෝ එක්කෝ තක්කඩියෝ ය; නැත්නම් අඥානයෝ ය.

මෙරට ඊනියා කෘෂිකාර්මික රටක් ලෙස සැමදාමත් තිබිය යුතු නො වෙයි. පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී මෙරට කෘෂිකාර්මික රටක් ලෙස හඳුන්වනු නො ලැබිනි. එකල මෙරට කර්මාන්ත නොතිබිණි යැයි පඬියකු කීමට ඉඩ ඇත. ඒ කෙසේවෙතත් අපට ඊනියා කාර්මික රටක් බවට පත්වීමේ ද අවශ්‍යතාවක් නැත. මේ කෘෂිකාර්මික, කාර්මික ආදී බටහිර සංකල්පවල ම ප්‍රශ්නයක් වෙයි. අප බුද්ධිමය වශයෙන් දීනයන් බවට පත්කෙරෙන මෙවැනි සංකල්ප හා ප්‍රවාදවලින් අප මිදිය යුතු ය. බටහිර මතවාදවලට වහල් වූ බොරු පණ්ඩිතයන් කුමක් කීවද මෙරට සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය සිංහල බෞද්ධ සංස්කෘතිය වෙයි. බටහිර නිර්නායක, දර්ශක ආදිය ඉවත ලා අප රටට සුදුසු ආර්ථික මෙවලම් පද්ධතියක් අප සකස්කර ගත යුතු වෙයි. එය සිංහල බෞද්ධ සංස්කෘතිය මත පදනම් විය යුතු ය. අද බටහිර ආර්ථිකය ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි සංස්කෘතිය මත පදනම් වෙයි. බටහිර ආර්ථිකය ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිය මත පදනම්වන අයුරු මැක්ස් වෙබර් පඬිවරයාගේ කාලයේ සිට සාකච්ඡා වී ඇත. බටහිර ආර්ථිකය පමණක් නොව බටහිර ආර්ථික ප්‍රවාද ඇතුළු සියළු බටහිර දැනුම් ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි සංස්කෘතිය මත පදනම් වෙයි. එය වෙබර්ලා විසින් සාකච්ඡා නොකෙරුණක් වෙයි. අප ද බටහිර ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු යැයි කියන්නෝ සෘජුව හෝ වක්‍රව හෝ අප සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානිකිරීමේ කටයුත්තේ නිරත වූවෝ වෙති.

එහෙත් මෙයින් කියැවෙන්නේ ඡුමාකර විද්වතා විසින් පැවසී ඇති ආකාරයේ බෞද්ධ ආර්ථිකයක් අප අනුගමනය කළ යුතු ය යන්න නො වෙයි. ඒ මහතා සඳහන් කර ඇති කරුණු වැදගත් නමුත් අප එයට වඩා ගැඹුරට යා යුතු ය. පදනමක් නොමැතිව උඩින් පල්ලෙන් අතගා ආර්ථිකයක් හෝ ආර්ථික විද්‍යාවක් හෝ සකස්කරගත නො හැකි ය. දළ ජාතික නිෂ්පාදිතය ආදී සංකල්ප සඳහා වෙනත් සංකල්ප ආදේශ කරනු වෙනුවට හා බෞද්ධ ආර්ථික විද්‍යාව ත්‍රිපිටකයේ ඇතැයි කියා සෑහීමකට පත්වනු වෙනුවට ආර්ථිකයේ ආකල්ප, දර්ශනය ආදිය ගැන අප සිත් යොමුකළ යුතු ය. එය පහසු වැඩක් යැයි මම නො කියමි. එහෙත් හුදු තාවකාලික ජයග්‍රහණ ගැන පමණක් අප නො සිතන්නේ නම් අපට වෙන මගක් ඇත්තේ ද නැත. බටහිර ක්‍රිස්තියානි ආර්ථිකය බයිබලයේ සඳහන් වී ඇතැයි කියන්නකු නැත.

මා මෙයින් අදහස් කරන්නේ බටහිර ආර්ථික විද්‍යාඥයන් ප්‍රෙතෙස්තන්ත ක්‍රිස්තියානි සංස්කෘතිය ගැඹුරින් අධ්‍යයනයකර ඉන්පසු බටහිර ආර්ථික විද්‍යාවේ සංකල්ප, ප්‍රවාද ආදිය නිර්මාණයකිරීම ආරම්භ කෙළේ ය යන්න නො වෙයි. ක්‍රිස්තු වර්ෂයෙන් පහළොස්වැනි සියවසේ සිට බටහිර නූතනත්වය සමග මේ සියල්ල එකිනෙක සමග සම්බන්ධවෙමින් ක්‍රමයෙන් ගොඩනැගුණි. දැනුම් නිර්මාණය, චින්තනය, සංස්කෘතිය හා බැඳෙයි. ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි සංස්කෘතිය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය බිහිකිරීමෙහි ලා මුල් පියවර තැබුණේ ඉතාලිය හා පෝලන්තය වැනි කතෝලික රටවල බව අප අමතක නො කළයුතු ය. එහි ලා පුරෝගාමී මෙහෙයක් ඉටුකළ මිචලාංජිලෝ, ගැලීලියෝ, කොපර්නිකස් ආදීහු කතෝලිකයෝ වූහ. මුළු ලොවම සංස්කෘතික වශයෙන් ප්‍රොතෙස්තන්තකිරීමේ කාර්යය ආරම්භ වූයේ ඉතාලියෙන් හා පෝලන්තයෙන් ය. ඉංගිරිසිහු ඒ ක්‍රියාවලිය ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කළහ. ගෝලීයකරණය ආදී නම්වලින් හැඳින්වෙන්නේ නූතනත්වයේ වර්තමාන ආක්‍රමණකාරී ක්‍රියා

© Prof. Nalin De Silva

පිළිවෙත ය. ධනවාදය මෙන් ම බටහිර විද්‍යාව හා තාක්ෂණය ද මේ ක්‍රියාවලියෙහි ම ප්‍රතිඵල විය. නිව්ටන් පමණක් නොව ඩාවින් ද සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වූහ. කොවූර වැනි පුහු යථාර්ථවාදීන් ගැන කියනුම කවරේ ද? දිවයින පුවත්පතේ අවුරුදු දහඅටකට පෙර කතාකර පල්ලම් බැස්ස වූ මතවාද ඇතැමුන්ට චූඩාමාණික්කයකි. ප්‍රංශ විප්ලවය දෙස ආපසු හැරී බලන විට පෙනෙන කරුණක් නම් එය යුරෝපීය වැඩවසම් ක්‍රමයෙන් (ෆියුඩලිසම් යන අර්ථයෙන්, ලංකාවේ කිසිදාක ඊනියා වැඩවසම් ක්‍රමයක් තිබී නැත. සුද්දන්ට පෙර මෙරට තිබුණේ එවැනි වැඩවසම් ක්‍රමයක් යැයි කියන්නෝ, බුද්ධිමය වශයෙන් ගත්කල, අඟුටුමිට්ටන් පමණක් නොව සුද්දන්ගේ අවජාතක දරුවෝ ද වෙති.) ධනපති ක්‍රමයට පරිවර්තනය වීමක් පමණක් නොව කතෝලික සංස්කෘතියෙන් ප්‍රොතෙස්තන්ත සංස්කෘතියට හැරීමක් ද බව ය. ප්‍රංශය අද ආගමෙන් කතෝලික රටක් බව සැබෑ ය. එහෙත් එය සංස්කෘතික වශයෙන් ප්‍රොතෙස්තන්ත ය. ප්‍රංශය ගැන පමණක් නොව ඉතාලිය ගැන ද කිවයුතුව ඇත්තේ ඒ කරුණම ය. ලංකාවේ ඕල්කට් බෞද්ධයෝ සංස්කෘතික වශයෙන් ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි වෙති. ඔවුහු ආගමෙන් බෞද්ධයෝ වෙති. බටහිර නූතනත්වයේ මතුපිටින් වෙන්කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ ආගම සංස්කෘතියෙන් වෙන් කෙරී ඇත. මෙය අපට ද ප්‍රයෝජනයට ගත හැකි ය. ඒ ආගමින් බෞද්ධයන් වී සංස්කෘතියෙන් ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි වීම සඳහා නො වෙයි. ඇතැම් සිංහලයන්ට ආගමින් කතෝලික හෝ ක්‍රිස්තියානි හෝ වී සංස්කෘතියෙන් සිංහල බෞද්ධවීම සඳහා ය. අපේ යහපතට ඉවහල්වන දෙයක් වේ නම් අපි එය ඕනෑම සංස්කෘතියකින් අවශෝෂණීය ව ලබාගන්නෙමු.

සිංහල බෞද්ධ ආර්ථිකයක්, ආර්ථික විද්‍යාවක් ගොඩනැගිය හැක්කේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මුල් බැසගත්තවුනට ය. සිංහල බෞද්ධ ආර්ථික විද්‍යාවක් මතු නොව වෙනත් ඕනෑම දැනුම් පද්ධතියක් ගොඩනැගිය හැක්කේ ඒ සඳහා නිර්මාණාත්මක ව මැදිහත්වීමෙන් ය. එහෙත් නිර්මාණ කාර්යය සඳහා අන්තර්ඥානයක් තිබිය යුතු ය. අන්තර්ඥානය යනු දූනුම ලබාගන්නා ක්‍රමයක් නොව දැනුම නිර්මාණය කිරීමේ දී උපකාරීවන්නක් බව චූඩා මාණික්කකාරියෝ නොදනිති. සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ ඔවුන්ට මොන අන්තර්ඥානයක් ද? අන්තර්ඥානයක් ලැබෙන්නේ මෙලෝ වශයෙන් ගත්කල සංස්කෘතියකින් ය. අනෙක් අතට එයට වාසනාව (පෙර කරන ලද පින්) තිබිය යුතු ය. සිංහලයන්ට සිංහල කවි නිර්මාණය කිරීම සඳහා සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ලැබුණු අන්තර්ඥානයක් විය. අද කවි වෙනුවට ඇතැමුන් බොරු දාර්ශනික පල්හෑලි ලිවීමට එක් හේතුවක් නම් ඔවුනට මේ අන්තර්ඥානය නො තිබීම ය. ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි අධ්‍යාපනය විසින් ඔවුන් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් වෙන්කෙරී ඇත. එහෙත් මේ අධ්‍යාපනය ලබාගත්තවුනට බටහිර ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි සංස්කෘතිය ද ගැඹුරින් ලැබී නැත. ඔවුන්ට ලැබී ඇත්තේ ඉතාමත් නොගැඹුරු බටහිර සංස්කෘතියක් පමණකි. එබැවින් ඒ සංස්කෘතියෙහි ද ඔවුන්ට අන්තර්ඥානයක් නැත. චූඩාමාණික්කවල දේශපාලන කතුවරුන්ට හා ලියන්නන්ට මෙලෝ අන්තර්ඥානයක් නැත. අවුරුදු එකසිය පණහකට වැඩි කාලයක් තිස්සේ ඉංගිරිසි අධ්‍යාපනයක් ලබාගත්ත ද අපට ඉංගිරිසි කවියකු, නවකතාකරුවකු, බටහිර විද්‍යාඥයකු බිහිකර ගැනීමට නොහැකි වී ඇත. අපට පමණක් නොව බොහෝ ආසියාතික රටවලට ද ඒ තත්ත්වය පොදු ය. ඒ බව බටහිරයන් ද තේරුම්ගෙන ඇති බව පෙනෙයි. රුෂ්ඩිලා, අරුන්දතී රෝයිලා පමණක් නොව ඔන්ඩට්ජිලා ද බටහිරයන්ගේ අනුග්‍රහයෙන් බිහිකෙරෙන්නේ එක් අතෙකින් මේ හිඩැස පිරවීමට ය.

වැව මෙරට ආර්ථිකයෙහි එදා පමණක් නොව අද ද මූලිකත්වයක් දැරිය යුතු ය. මෙතෙක් කල් ඒ නොසලකා තිබීමෙන් ම මෙරට විජාතික බලවේගවල ආධ්‍යාත්මික හිස්බව පෙන්නුම් කෙරෙයි. අද හෝ වැව මතක්වීම යහපත් අනාගතයක් සඳහා සුබ පෙර නිමිත්තකි. එහෙත් එහි දී කරුණු දෙකක් මතක්කර දිය යුතු ය. පළමුවෙන් ම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට පළමුව වැව ගැන දැනගත යුතු ය. එය අපේ ආර්ථිකයේ පමණක් නොව සංස්කෘතියේ ද වැදගත් තැනක් උසුලයි. වැව හුදු ආර්ථික මෙවලමක් පමණක් නො වෙයි. වැව් සංස්කෘතිය දන්නා පිරිස් ද වැව් දහසක් සඳහා සහභාගිකර ගතයුතු ය. එමෙන් ම වැව් නිර්මාණය ගැන ද දන්නා අය වෙති. ඔවුන්ගේ උපකාරය ද මෙහි දී අවශ්‍ය වෙයි. වැව පිළිසකර කිරීම සඳහා වැව් තාවුල්ල නැතිකර ගත යුතු නො වෙයි. එමෙන් ම විවිධ වැව් වර්ග ඇති බවත් ඒ ඒ වැව කිනම් වර්ගයකට අයත් ද යන්නත් දැනගත යුතු ය. මේ සියල්ල පිළිබඳ දන්නා උදවිය තවමත් රජරට වාසයකිරීම අපේ වාසනාවකි. ඒ අයගේ ද පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ජාතිකත්වය අගයන නිලධාරීන් ගේ ද සහාය මෙහි දී අවශ්‍ය වෙයි. දෙවනුව මෙය දේශපාලන ව්‍යාපෘතියක් නොවිය යුතු ය. ඒ ක්ෂණික දේශපාලන වාසි සඳහා ඇතිකරන සෙප්පඩ විජ්ජාවක් නොවිය යුතු ය. දහසක් මහා වැව් ජාතික ආර්ථිකයක් සඳහා විය යුතු ය ~

© Prof. Nalin De Silva